# ජනාධිපතිවරණය - 2019.11.16

## තැපැල් ඡන්ද සළකුණු කිරීම පිළිබඳ දැනුම් දීම

ඉහත සඳහන් ඡන්ද විමසීම වෙනුවෙන් තැපැල් ඡන්ද හිමියන්ට තම ඡන්දය සලකුණු කිරීම සඳහා 2019.10.31 හා 2019.11.01 යන දිනයන්හි අදාළ සේවා ස්ථානවල දී පහසුකම් සලසන ලෙස තේරීම්භාර නිලධාරීන් මගින් සියලුම සහතික කිරීමේ නිලධාරීන්ට දන්වා යවා ඇත. තැපැල් ඡන්ද සලකුණු කිරීමේ ස්ථානවලට ආරක්ෂාව සැපයීමට හා අධීක්ෂණය කිරීම සඳහා නිලධාරීන් යෙදවීමට සිදුවී ඇති හෙයින්, සියලුම පොලිස් ස්ථානවල සහ සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල තැපැල් ඡන්දය සලකුණු කිරීම 2019.11.04 හා 05 දිනවල සිදු කිරීමට නියමිතය. එම දිනවලදී නොවැළැක්විය හැකි හේතුවක් නිසා ඡන්දය සලකුණු කිරීමට නොහැකි වූ තැපැල් ඡන්දදායකයකුට එම පහසුකම 2019.11.07 වන දින පෙරවරු 7.00 සිට පස්වරු 4.00 දක්වා අදාළ සහතික කිරීමේ නිලධාරියාගේ කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී සලසාගත හැක.

02. මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයන් සඳහා වූ තැපැල් ඡන්ද සලකුණු කිරීමද 2019.11.07 ට යොදා ඇත.

03. තැපැල් ඡන්ද සලකුණු කරන අවස්ථාවන් නිරීක්ෂණය සඳහා එක් සහතික කිරීමේ නිලධාරී කාර්යාලයක් වෙත අපේක්ෂකයකු වෙනුවෙන් එක් නියෝජිතයකු හා එක් නිරීක්ෂණ ආයතනයක් වෙනුවෙන් එක් නිරීක්ෂකයකු බැගින් පත් කළ හැකි ය. මෙම කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL) හා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට (CMEV) අවසර ලබා දී ඇත. අදාළ සහතික කිරීමේ නිලධාරී කාර්යාලයේ සේවයේ නියුතු කිසිවකු අපේක්ෂකයකු හෝ නිරීක්ෂණ සංවිධානයක් වෙනුවෙන් එම ආයතනයේ තැපැල් ඡන්ද සලකුණු කිරීමේ ස්ථානයේ නිරීක්ෂණ කටයුතුවල නිරත විය නොහැක.

- එම ස්ථානවල සහතික කිරීමේ නිලධාරියාට සහාය වීම සඳහා තම කාර්යාලයේ නිලධාරීන් කිහිපදෙනකු හා සහායකයකු හෝ දෙදෙනකු වැනි කුඩා පිරිසක් යොදා ගැනීමට ද අවසර ඇත.
- තවද, මෙම ස්ථානවල කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් සහකාර තේරීම්භාර නිලධරයන් හා සහායක නිලධරයන් යොදවනු ඇත.

04. ඉහත 03 ඡේදයේ සඳහන් අයට සහ තැපැල් ඡන්ද හිමියන් වශයෙන් පිළිගෙන ඇති අයට පමණක් තැපැල් ඡන්ද සලකුණු කිරීමේ ස්ථානයකට ඇතුළුවීමට අවසර ඇත.

05. තැපැල් ඡන්දය සලකුණු කිරීම්, තැපැල් ඡන්දය විමසන ස්ථාන හා පරිශ්‍ර ඡායාරූපගත කිරීම, වීඩියෝ ගත කිරීම තහනම් වේ.

06. විශේෂයෙන් පහත දැක්වෙන මැතිවරණ නීතියේ සඳහන් වරදවල් කිසිවෙකු විසින් මෙම ස්ථානවල සිදු නොකළ යුතු ය.

1. ඡන්දය සලකුණු කිරීමට පහසුකම් සලසන සහතික කිරීමේ නිලධාරියාගේ කාර්යාලය පිහිටි පරිශ්‍රයේ අපේක්ෂකයෙකුගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මුද්‍රණය කරන ලද කිසිදු ඡායාරූපයක්, පත්‍රිකාවක්, සලකුණක් හෝ ලකුණක් ප්‍රදර්ශනය නොකළ යුතුය. ඒ වෙනුවෙන් අත් පත්‍රිකා නොබෙදිය යුතු ය.
2. එම ස්ථානවලදී ඡන්දය ආයාචනය කිරීම හෝ අපේක්ෂකයෙකුට ඡන්දය නොදෙන ලෙස ඡන්දහිමියකු පෙළඹවීම වරදකි.
3. එම ස්ථානවල හෝ තදාසන්නයේ ඡන්ද විමසීමට බාධා වන කිසිදු ක්‍රියාවක් නොකළ යුතු ය.
4. ඡන්දය ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාවක් හෝ ලකුණු නොකරන ලද ඡන්ද පත්‍රිකාවක් හෝ එම ස්ථානයෙන් පිටතට රැගෙනයාමට උත්සාහ දැරීමද වරදකි.
5. ලකුණු කරනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් කිසිවෙකුට ප්‍රදර්ශනය කිරීම තහනම්ය.
6. ලකුණු නොකළ හෝ ලකුණු කළ ඡන්ද පත්‍රිකාවක් ඡායාරූපගත කිරීම හෝ වීඩියෝ කිරීම හෝ එසේ ලබාගන්නා ඡායාරූප සමාජ ජාල මාධ්‍ය ඇතුළු ඕනෑම මාධ්‍යයක් හරහා ප්‍රදර්ශනය කිරීම සම්පූර්ණයෙන් තහනම් වන අතර, එසේ කිරීමට දරන ප්‍රයත්න පවා මැතිවරණ කොමිෂන් සභාවේ විධාන කඩකිරීමක් ලෙස සලකා ක්‍රියාකරනු ලැබේ.
7. ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාවක් ප්‍රදර්ශනය කරන ලෙස තැපැල් ඡන්දදායකයෙකුට බල කිරීම හා එසේ පෙන්වීමද වරදකි.

07. තැපැල් ඡන්දය පාවිච්චි කරනු ලබන ස්ථානවල කටයුතු සාමකාමීව පවත්වාගෙන යාම සඳහා පොලීසියේ සහාය යම්කිසි සහතික කිරීමේ නිලධාරියෙකු හෝ තේරීම්භාර නිලධාරියා විසින් මෙම කටයුතු අධීක්ෂණය කිරීම සඳහා පත් කර ඇති නිලධරයෙකු හෝ ඉල්ලා සිටියහොත් එම සහාය ලබා දෙන ලෙස පොලිස්පතිවරයාගෙන් ඉල්ලා ඇත.

08. තැපැලෙන් ඡන්දය දීමේදී ඡන්දදායකයා විසින් ස්වකීය ඡන්දය සලකුණු කර ඇති ආකාරය කිසිවෙකුටත් සොයාගත නොහැකි බවත් සියළුම තැපැල් ඡන්ද සලකුණු කිරීමේ මධ්‍යස්ථානවල තැපැල් ඡන්ද නිදහස් හා රහස්‍ය ලෙස සලකුණු කිරීමට අවස්ථාව සලසා ඇති බවත් යම් තැපැල් ඡන්ද සලකුණු කිරීමේ ස්ථානයක ඡන්දය දීමට බාධාවන හෝ බලපෑම් කිරීමට හෝ උත්සාහ කලහොත් එකී ස්ථානයේ ඡන්ද විමසීම අවලංගු කරන බවත් නිවේදනය කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2019.10.17